# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

**6 ශ්‍රේණිය**

## ගණිතය - I

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2යි

**I කොටස**

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01) $275 \times 100$ හි අගය සොයන්න.

02) $7208 + 916$ හි අගය සොයන්න.

03) 1948 පෙබරවාරි 4 වැනිදා අන්තර් ජාතික සම්මත ක්‍රමයට ලියන්න.

04) 7508008 යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා එය කියවන ආකාරය ලියන්න.

05) මෙම තල රූප දෙක සඳහා භාවිතා කරන නම් ලියන්න.



...........................................



...........................................

06) මෙම රූපය සංවෘත තල රූපයක් වේද? හේතුව කුමක්ද?



07) $215cm$, මීටර් හා සෙන්ටිමීටර් වලින් ලියන්න.

08) ඝනකයක

i. මුහුණතක හැඩය කුමක්ද? ............................

ii. මුහුණත් ගණන කීයද? ...........................

09) $4.75 - 1.84$ සුළු කරන්න.

10) 10 ත් 20 ත් අතර ඔත්තේ සංඛ්‍යාවක් 3 හි ගුණාකාරයක් වේ. එම සංඛ්‍යාව කුමක්ද?

11) $\frac{3}{4}, \frac{1}{5}, \frac{2}{3}, \frac{4}{7}, \frac{1}{8}$ මෙම භාග අතුරින් ඒකක භාග තෝරා ලියන්න.

12) $12.08$ කියවන ආකාරය ලියන්න.

13) $1.45l$, මිලි ලීටර් වලින් ලියන්න.

14) පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන්කර රවුම් තුල ලියන්න.




15) $\frac{71}{100}$ දශම සංඛ්‍යාක් ලෙස ලියන්න.

16) $-4, 0, 1, -2$ යන නිඛිල සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.

17) වේලාව 12.00 සිට 7.00 වන විට පැය කටුව භ්‍රමණය වී ඇත්තේ කවර වර්ගයේ කෝණයකින්ද?




18) සෘජුකෝණාස්‍ර ඉඩමක පළල $20m$ කි. දිග $35m$ කි. එහි පරිමිතිය සොයන්න.

19) $\frac{3}{4}$ …… $\frac{3}{8}$ හිස්තැනට සුදුසු පරිදි $<$ හෝ $>$ ලකුණ යොදන්න.

20) 10 වැනි සමචතුරස්‍ර සංඛ්‍යාව කීයද?

## II කොටස

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

01)

a) තල රූප ඇසුරින් ඔබ නිර්මාණය කරන ලද ඝන වස්තු පිළිබඳ සිහිපත් කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඝනකයක පතරොම අඳින්න.

ii. මෙම ඝනවස්තුවේ නම ලියන්න.







iii. ඉහත ඝනවස්තුවේ දී ඇති මිනුම් අනුව දී ඇති පතරොමේ හිස්තැන් ඇති පැතිවල දිග ලියන්න.

b)



i. මෙම පතරොම භාවිතයෙන් සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න.

ii. ඉහත පතරොමෙන් සාදන ඝනවස්තුවේ මුහුණතක හැඩය කුමක්ද?

iii. මෙම සවිධි ඝන වස්තුවේ

a) මුහුණත් ගණන .......

b) දාර ගණන ...........

c) ශීර්ෂ ගණන ................ ලියන්න.

iv. එම ඝනවස්තුවේ දාරයක දිග 8cm නම් ඉහත පතරොමේ පරිමිතිය සොයන්න.

02)

a) 4708250007 යන සංඛ්‍යාව

i. සම්මත ආකාරයට ලියන්න.

ii. බිලියන කලාපයට යටින් ඉරක් අඳින්න.

iii. සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න.

b) 47652 මගින් දැක්වෙන සංඛ්‍යාවේ

i. 5 න් නිරූපණය වන අගය කීයද?

ii. 7 න් නිරූපණය වන අගය කීයද?

iii. 4 හි ස්ථානීය අගය කුමක්ද?

03)

a) හිස්තැන්වලට ගැළපෙන අගයන් ලියන්න.

i. 40 = 1 × ............
= 2 × ............
= 4 × ............
= 5 × ............

ii. 40 හි සියලුම සාධක ලියන්න.

iii. 40 හි ප්‍රථමක සාධක ලියන්න.

b)

i. 4 හි පළමු ගුණාකාර දහය ලියන්න.

ii. 10 හි පළමු ගුණාකාර හය ලියන්න.

iii. 4 හා 10 හි පොදු ගුණාකාර තුනක් ලියන්න.

04) සෘජුකෝණාස්‍රයක පළල $15cm$ කි. එහි දිග එමෙන් තුන් ගුණයකි.

i. සෘජුකෝණාස්‍රයේ දිග කීයද?
ii. එහි පරිමිතිය සොයන්න.
iii. එවැනි සෘජුකෝණාස්‍ර 2ක් පළල අතට සම්බන්ධ කිරීමෙන් සෑදෙන සෘජුකෝණාස්‍රයේ දළ සටහන ඇඳ පරිමිතිය සොයන්න.
iv. එවැනි සෘජුකෝණාස්‍ර දෙකක් දිග අතට සම්බන්ධ කිරීමෙන් ලැබෙන සෘජුකෝණාස්‍රය ඇඳ එහි පරිමිතිය සොයන්න.
v. පරිමිතිය විශාල වන්නේ කුමන ආකාරයට සම්බන්ධ කිරීමෙන් ද?

05)

i. සරල රේඛා අඳීමට ඔබ භාවිතා කරන ගණිත උපකරණය කුමක් ද?
ii. සංවෘත්ත සරල රේඛීය තල රූප දෙකක් ඇඳ දක්වන්න.
iii. A, B, C, D රූපවල නම් ලියන්න.




iv. C හැඩතලය මුහුණතක් වන සේ සෑදිය හැකි ඝනවස්තුවේ නම ලියන්න.

06)

(a) පොදු ලක්ෂණ අනුව කොටුව තුළ ඇති ද්‍රව්‍ය කාණ්ඩ කොටස් දෙකකට වෙන්කර ලියා ඒවට සුදුසු නම් ලියන්න.




..................................................................

..................................................................

(b)

i. $\frac{3}{4}+\frac{1}{8}$ සුළු කරන්න.
ii. $\frac{3}{7},\frac{3}{5},\frac{3}{10},\frac{3}{4}$ ආරෝහණ පිළිවෙලට ලියන්න.
iii. හරය 7ට වැඩි ඒකක භාග දෙකක් ලියන්න.

a) $15ml, 800l, 200ml, 1ml, 3l$ මෙම ජල ප්‍රමාණ අතුරින් ගැළපෙන අගයන් පහත ඒවායේ හිස්තැනට සුදුසු ලෙස යොදන්න.

i. ඇසට යොදන බෙහෙත් ප්‍රමාණය - ................................
ii. මිනිසකුට දිනකට නෑම අවශ්‍ය ජලය - ................................
iii. දිනකට මිනිසකු බීමට ගත යුතු ජල ප්‍රමාණය - ................................
iv. වරකට බීමට ගන්නා බෙහෙත් ප්‍රමාණය - ................................
v. බීම වීදුරුවකට අල්ලන බීම ප්‍රමාණය - ................................

b)

i. සංඛ්‍යා රේඛාවක ලක්ෂණ දෙකක් ලියන්න.
ii. -10 සිට 5 තෙක් සංඛ්‍යා රේඛාවක් ඇඳ -7, +4, -2, 2 යන සංඛ්‍යා නිරූපණය කරන්න.